**PMB/OP/ISSUE/2019-01** **2019.01.09**

**වී අලෙවි මණ්ඩලයේ ලියාපදිංචි සියලුම වී මෝල්හිමියන් වෙත,**

**වී අලෙවි මණ්ඩලය සතු සුළු වශයෙන් ඉතිරි වී තොග සහ 2017/18 මහ සහ 2018 යල මිලදී ගත් වී තොග අලෙවි කිරීම සඳහා අයදුම්පත් කැඳවීම -2019**

වී අලෙවි මණ්ඩලය සතු සුළු වශයෙන් ගබඩා වල ඉතිරි වී තොග, 2017/18 මහ සහ 2018 යල මිලදී ගත් වී තොග අලෙවි කිරීමට තීරණය කර ඇත. දිස්ත්‍රික් මට්ටමින් අලෙවි කිරීම සඳහා පවතින වී තොග **ඇමුණුම 01** පරිදි වේ.

**වී විකිණීමේ කොන්දේසි -**

1. මෙම වී තොග මිලදි ගැනිමට අපේක්ෂා කරන වී අලෙවි මණ්ඩලයේ 2018 වර්ෂයේ ලියාපදිංචි වී මෝල් හිමිකරුවන්ට 2019.01.14 දින සිට 2019.01.22 දින දක්වා ඉල්ලුම් කල හැකි අතර ඉල්ලුම්පත් 2019.01.14 දින පෙ.ව.9.00 සිට 2019.01.22 දින ප.ව. 2.00 දක්වා භාරගනු ලැබේ. වී තොග ඉල්ලුම් කරන අනුපිළිවෙල අනුව නිකුත් කරන බවත් ඉහත සඳහන් මිල ගණන් යටතේ නිකුත් කරන බවත් කාරුණිකව දන්වා සිටිමි. ඉලුල්ම්පත් ඉදිරිපත් කිරීම ෆැක්ස් මගින් සහ ඊමේල් මගින් (0112-335410) හෝ අතින් ගෙනවිත් භාර දීමට හෝ ලියාපදිංචි තැපැල් මගින් සභාපති, වී අලෙවි මණ්ඩලය, නිවාස මහලේකම් ගොඩනැගිල්ල, සර්. චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට එවිය හැක.
2. එක් අයදුම්කරුවකු සඳහා ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පත්‍රයක් පමණකි. අයදුම්පත සමග ආපසු නොගෙවන රු.2,000.00 ක තැන්පතුවක් ලංකා බැංකුවේ රාජගිරිය ශාඛාවේ වී අලෙවි මණ්ඩලය නමින් 6662403 අංක දරණ ගිණුමට බැර කර අයදුම්පත්‍රය සමග එවිය යුතුය.
3. ඉල්ලුම් කළ හැකි අවම වී ප්‍රමාණය (සම්බා හැර) එක් දිස්ත්‍රික්කයක් සඳහා කිලෝ ග්‍රෑම් 20,000 (මෙ.ටො 20) ක් වන අතර, වී මෝල් හිමියන්ගෙන් ලැබෙන අයදුම්පත් ප්‍රමාණය අනුව එක් ඉල්ලුම් කරුවෙකුට ලබාදෙන ප්‍රමාණය තීරණය කරනු ලැබේ.
4. වී මිලදී ගන්නා ලෙස දැන්වීමෙන් පසු රාජකාරි දින 05 ක් ඇතුළත මුදල් එකවර හෝ උපරිම කොටස් තුනක් වශයෙන් ගෙවීමෙන් පසු එදින සිට රාජකාරි දින 14 ක් ඇතුළත වී තොග ගබඩා වලින් ඉවත් කර ගත යුතුය. අදාල කාලසීමාවෙන් පසුව වී තොග නිකුත් කිරීම අත්හිටවනු ලබන අතර බැහැර කර නොගත් තොගයේ වටිනාකමින් 10% ක් අයකර ගැනීමෙන් අනතුරුව ඉතිරි මුදල් නිදහස් කරනු ලැබේ.
5. වී තොග ගැනුම්කරුවන් වෙත නිකුත් කිරිමේදී ඇසුරුම් මල්ලක් සඳහා රු.30.00 බැගින් ගෙවිය යුතුය.
6. තොග බැහැර කිරීමේ පිරිවැය ගැණුම්කරු දැරිය යුතුය.

7. 2019.01.16 දින සිට2019.01.18 දින දක්වා සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා තුළ අදාළ ගබඩා වලදී වී තොග පරීක්ෂා කර බැලිය හැකිය.
8. වී තොග අලෙවි කිරීම සම්බන්ධ අවසාන තීරණය වී අලෙවි මණ්ඩලය සතු වේ.

9. අයදුම්පත් ඉදිරිපත් කිරීම පහත පරිදි සිදු කළ යුතුය.

   I. ෆැක්ස් මගින් අයදුම්පත ලැබීමට සැලැස්වීම - ෆැක්ස් අංකය 0112335410

   II. chairmanpmb@gmail.com යන විද්‍යුත් තැපැලට එවිය යුතුය.

   III. අයදුම්පත අතින් භාර දීම -
   වී අලෙවි මණ්ඩලය ප්‍රධාන කාර්යාලයේ අයදුම්පත් භාරගන්නා අංශයට භාරදිය යුතුය.

   IV. ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත් එවීම -
   නිසිලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2019.01.22. දින ප.ව. 2.00ට ප්‍රථම සභාපති, වී අලෙවි මණ්ඩලය, නිවාස මහලේකම් ගොඩනැගිල්ල, සර්. චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කළ යුතුය. අයදුම්පත් එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "වී මිලදී ගැනීම සඳහා අයදුම් පත් ඉදිරිපත් කිරීම -2019" යනුවෙන් සඳහන් කළ යුතුය.

ඉහත තුන් ආකාරවලින් එක් ආකාරයකින් පමණක් අයදුම් කළ යුතු අතර අයදුම්පත් කිහිපයක් ඉදිරිපත් කළ අයදුම්පත් සහ නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වැඩිදුර තොරතුරු වී අලෙවි මණ්ඩලයේ පහත සඳහන් දුරකතන අංක ඔස්සේ ලබා ගත හැකිය.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(මෙහෙයුම්) -0112335414

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(මුදල්) - 0112335412
ගිණුම් අංශය - 0112-4331484

සමන් පාලිත බණ්ඩාර
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)
වී අලෙවි මණ්ඩලය

අත්සන් කලේ/ සභාපති
වී අලෙවි මණ්ඩලය